# හිවකේතේගම ජන සවිය



ජනසවිය ප්‍රකාශන : 9

BKT 0177
26/08/2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# නවගත්තේගම ජනසවිය

## ගම් පියසක් ජනසවියෙන් පිබිදුනු හැටි

ජනසවිය උත්සාහයයන් : අංක 8

ප්‍රකාශනය :

ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව
1992 මැයි

# හැඳින්වීම

ජනසවිය දෙවන වටය ක්‍රියාත්මක වන නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනසවිය වැඩ සටහන පිළිබඳව සංක්ෂිප්ත ලේඛණයක් සකස් කිරීම මෙහි අරමුණයි.

මෙම වැඩ සටහන නිර්මාණාත්මකව ක්‍රියාත්මක කිරීමට පසුගිය වසරේ වෙහෙස වූයෙමු.

එම උත්සාහයේ පාඩම් හා අත්දැකීම් ජනසවිය වැඩ සටහන සම්බන්ධව උනන්දුවක් හා කැපවීමක් දක්වන අයවලුන් සඳහා මෙවැනි කුඩා ප්‍රකාශයක් සම්පාදනය කිරීම කාලෝචිත යැයි අදහස් කෙලෙමු.

මෙය අප වැඩ සටහන සම්බන්ධ සංක්ෂිප්ත ලේඛනයක් මිස සවිස්තරාත්මක ප්‍රකාශණයක් නොවේ. මෙය එබඳු පාඩම් සහ අත්දැකීම් සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමට දරන වෙර වෑයමක ආරම්භයකි.

ජනසවිය වැඩසටහනයි, වයඹ පළාත්සභාවේ නිප්බිම වැඩසටහනයි අතර පවතින සම්පත්වයද මේ කෙටි සටහන් පෙළින් පැහැදිලි වෙනු ඇත.

* පවතින දුෂ්කරතා (තවාතැන්, ජලය, විදුලිය, සෞඛ්‍යය හා ප්‍රවාහන ආදි) හේතුකොට ගෙන අවශ්‍ය රාජ්‍ය සේවා වැනි නිලධාරීන්ගේ උග්‍ර හිඟයක් පවතී.

## ජනසවිය තේරුම් ගැනීම සහ දුප්පතුන් පෙළ ගැසීම

1. ප්‍රාදේශීය ලේකම් හා ජාතික පුහුණුකරු මූලික හුරුව ලබා ගැනීම (කොළඹ ජාතික මට්ටමේ වැඩමුළුවලදී)

2. ප්‍රාදේශීය පුහුණුකරුවන් හා ග්‍රාම නිලධාරීන් හුරුකිරීම (ප්‍රාදේශීය ලේකම් හා ජාතික පුහුණුකරු විසින්)

3. ජනහමු පැවැත්වීම (ප්‍රාදේශීය ලේකම්, ජාතික පුහුණුකරු, ප්‍රාදේශීය පුහුණුකරුවන් හා ග්‍රාම නිලධාරීන් ඒකාබද්ධව)

මෙම ප්‍රායෝගික පුහුණු ක්‍රියාවලියට සහභාගි වන්නන්
* ජනතාව
* ග්‍රාම නිලධාරීන්
* ප්‍රාදේශීය පුහුණුකරුවන්
* ව්‍යාපෘති සේවා නිලධාරීන්
* ජාතික පුහුණුකරු
* ප්‍රාදේශීය ලේකම්

දේශන, සාකච්ඡා, වාද විවාද හා ප්‍රශ්න කිරීම් පදනම් කරගෙන පෝෂණ හා ප්‍රතිපෝෂණ වැඩපිළිවෙලකින් දැනුවත් කිරීම දියත් විය. න්‍යායයෙන් කිරීම මත නොව කිරීමෙන් ඉගෙනුම මත මෙය රැඳිණි. ජනසවිය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය මෙයින් ජනිත විය.

* ජනතාවගේ සවිය "ජනසවිය"
* රු. 700ට අඩු මාසික ආදායමක් ලබන පවුල් තගා සිටුවීම.
* සම්ප්‍රදායික නොවූ සංවර්ධන වැඩ පිළිවෙලක්. දුප්පතුන්ට නිශ්චිතවම ඉලක්ක කරන ලද්දක්.
* සහල් සලාකය/ආහාර මුද්දර නොවේ.
* උපයන වැඩපිළිවෙළක්/ආයෝජන වැඩ සටහනක්.
* ඉහළ සිට පහළට වූ සම්ප්‍රදායික සංවර්ධනයට විරාමයක්.
* පෝෂණ වැඩ පිළිවෙලක් ම නොවේ.

- ✡ දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙලක්.
- ✡ දුප්පත්කම තුරන් කරන අර්බුදය විසඳන විනය ඇති කර වැඩ පිළිවෙලක්.
- ✡ පහල සිට ඉහලට යන සංවර්ධන වැඩ පිළිවෙලක්.

ජනහමුව සම්ප්‍රදායික සංවිධාන, සමිති සමාගම් වලට විකල්පයකි. ජනහමුවේ ක්‍රියාකාරකයෝ ජනහමුවෙන්ම තේරුණ සහාය කණ්ඩායම වේ

4. දුප්පතුන් පෙළ ගැසීම.

- ✡ ජනසවිය තේරුම් ගත් ජනහමුව සතු ප්‍රථම කාර්යය වූයේ දුප්පතුන් පෙළ ගැස්වීම/සංවිධානය වීම විය.
- ✡ එහිදී ග්‍රාම නිලධාරී/ප්‍රාදේශීය පුහුණුකරු සහ සහාය කණ්ඩායම මැදිහත්වීම යටතේ දුප්පතුන් අනුපිළිවෙල ගැණුනි.

# කලම්බනය

තවගත්තේගම ජනසවිය වැඩ සටහනේ වූ දැනුවත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය ලේකම් ජාතික පුහුණුකරු, ප්‍රාදේශීය පුහුණුකරු ග්‍රාම නිලධාරී ව්‍යාප්ත සේවා නිලධාරීන් සහාය කණ්ඩායම හා ජනසවිලාභීන් පුහුණු වැඩ මුළු කිපයකින් මූලික යොමු කිරීමක් පමණි සිදු වූයේ.

මෙම යොමු වීම ප්‍රායෝගිකව පෝෂණය සහ ප්‍රතිපෝෂණය වන වැඩ සටහනක් බවට පත් වූයේ, "කලම්බන" ක්‍රියාවලියෙනි.

කලම්බනය යන්නෙන් අදහස් කරන්නේ ජනහමු සහ කුඩා කණ්ඩායම් හමුවීම භාවිතා කර, එය සාකච්ඡා මණ්ඩප ලෙස යොදවා ගනිමින් ගැටළු හා විසඳුම් මතු කර ගැනීම සඳහා පෙළැඹවීමයි. සංවාදශීලී ගතිය ඇති කිරීමයි. මෙහිදී සියළුම සහභාගී වන්නන් ගේ උද්යොගය, දැනුවත්කම, විමර්ශනශීලීත්වය සහ දයකත්වය ලබා ගැනීම සිදුවිය.

මේ තුළින් සහභාගී වන්නන් සියළු දෙනා මැදිව සිටින ගතානුගතික රටාව පිළිබඳව විමර්ශනශීලී සිතා බැලීමකට ඇද ගැනීමක් සිදු විය. ජනහමුවේදී මෙය පුළුල් ලෙසත්, කුඩා කණ්ඩායමේදී ගැඹුරිනුත් සාකච්ඡාවට භාජනය කෙරේ. එතුළින් ජනසවිය වැඩ සටහනේ මුල් ක්‍රියාවලියට සියළු දෙනා යොමුවෙති. ඒ කියන්නේ "ඇයි අපි දුප්පත්" යන ප්‍රශ්නය ඇසීමට ජනසවිලාභීන් යොමු වීමයි.

ඇයි අපි දුප්පත්

"සියයට අනූපහක් ගොවියෝ වූ අපට වතුර නෑ. ඉතිං කොහොමද ගොවිතැන් කරන්නේ"

"මහවැලිය වැනි ව්‍යාපාරයක නැති එක"

"වගාව වල් අලි පාලු කරනවා."

"කොහොම හරි වැව්වත් අපිට විකුණන්න වෙන්නේ තුට්ටු දෙකට."

"අපිට ගොවිතැන් කරන්න මුදල් නෑ. ඒක හන්ද ගිනි පොලියට ණය වෙලා ණය බේරන එක විතරයි කරන්ඩ වෙන්නේ."

"අපි කරන්නේ සුමානෙ වළං බිඳින එකයි."

"අපිට වැඩ කරන්න වෙලාවක් නැහැ. කුලියට නොගියොත් එදවේල කන්ඩ නැහැ."

"මේ ඔක්කොම නිසා අපි රාජාංගනයට කුලියට යනවා. එක්කෝ දංකොටුවේ උළු මෝල්වලට යනවා. හම්බ වෙන තුට්ටුව කන්ඩයි, මගටයි විතරයි."

"මේවා හන්ද අපට හොඳ කෑම වේලක් නෑ.
'හොඳ ගෙයක් නැහැ.'

'ළමයි ස්කෝලෙ ඇර ගන්න විදියක් නැහැ.'

'හරියට අඳින්න පළඳින්න නැහැ.'

'හරිහමන් වැසිකිළියක් නැහැ'

'ලෙඩට දුකට බෙහෙතක් නැහැ'

'හොඳ මඟ පෙන්වීමක් නැහැ.'

'අපට දැනුමක් නැහැ.'

මේ ජනහමුව ගතානුගතික සමිති සමාගම් වල පැවති සාකච්ඡාවන්ට වඩා ගැඹුරින්ද, උණුසුම්වද දුප්පත්කම පිළිබඳ ගැටළු සාකච්ඡාවට භාජනය වේ. මෙය ජනසවියලාභියාට මෙන්ම ඔවුනගේ නියෝජිතයින් වන සහාය කණ්ඩායමට ජනසවිය වැඩ පිළිවෙළ පිළිබඳව තම දයකත්වයේ සහ වගකීමේ ස්වභාවය අවධාරණය කරයි.

මෙම ජනහමුවට සහභාගී වන රාජ්‍ය සේවකයින්ට සහ පුහුණුකරුවන්ට ද මෙම කලම්බනය විශාල බලපෑමක් ඇති කරයි. මෙතෙක් කල් තමාට අදාළ විෂයයට සීමා වී තනි තනිව පුද්ගලයින් හමු වී දෙනු ලබන උපදෙස් හා මඟ පෙන්වීම් වල තිබෙන නිසරු බව මෙය තුළින් ඉගෙන ගනී.

" අපි සියල්ල දන්නෝ නොවෙමු. අවුරුදු හැට, හැත්තෑවක් ජීවන අරගලයක යෙදෙන දුප්පතුන්ගෙන් අපි උගතගත වෙමු. " ...... යන හැඟීම ජනිත විය.

මෙතෙක් කල් රාජ්‍ය සේවකයින්ගේ උත්සාහය, එකිනෙකට බැඳුණු ගැටළු ජාලයක එක් අංගයක් පමණක් බව වටහා ගනී. එයට පිළියම් කිරීම කොටස් වශයෙන් නොව ඒකාබද්ධ උත්සාහයක් විය යුතු බව අවබෝධ විය. එම ඒකාබද්ධ උත්සාහය තුළ තමන්ගේ දායකත්වය හා වගකීම එකිනෙකා තේරුම් ගත්තා.

මෙම කලම්බනයේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩ සටහනේ මතු වූ ගැටළු ජනසවිය අරටු කණ්ඩායමේ (මෙහෙයුම් කමිටුවේ) සාකච්ඡාවට භාජනය විය. මෙම අරටු කණ්ඩායම ප්‍රාදේශීය ලේකම්, ජාතික පුහුණුකරු සහ ප්‍රාදේශීය පුහුණුකරු, ග්‍රාම නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන්, සමූපකාර නිලධාරීන්, බැංකු නිලධාරීන් අතරින් තෝරා ගත් කණ්ඩායමකින් සමන්විත වේ. මොවුන් වැඩසටහනේ ක්‍රියාත්මක අංශය තුළින් මතු වූ අය වේ.

මෙම කණ්ඩායම ජනහමුවලින් මතු වූ ගැටළු සම්බන්ධයෙන් සිය පෞද්ගලික විෂය ඥානය, ප්‍රාදේශීය සහ ජාතික අත්දැකීම් හා මඟ පෙන්වීම් ඉවහල් කර ගෙන දළ වැඩ සටහනක් සම්පාදනය කරන ලදි. මෙම දළ වැඩ සැලැස්ම නැවත ජනහමුව හා කුඩා කණ්ඩායම්වලට යොමු කෙරේ. ඒ සමගම නැවත ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන් කණ්ඩායමත්, ජනසවිලාභීනුත් එක් වූ ජනහමුව තුළ පෝෂණය සහ ප්‍රති පෝෂණය යන ගුණාංගය ඇතිවන කලම්බනය නැවත නැවත සිදුවේ. මෙම සංවාදාත්මක වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස නවගත්තේගම වැඩසටහනේ ඉලක්ක මතු විනි.

# ඉලක්ක

මෙම ඉලක්ක ජනසවිය වැඩ සටහන අවසානයේ ඇතිවන නිර්මාණයේ චිත්‍රයයි.

1. **ස්ථාවර ආර්ථිකයක් :**

(i) නත්න ක්‍රමයෙන් තොර වගා රටාවක්. (කෘෂි ළිං හෝ/ස්වාභාවික ජල සම්පත් උපයෝගී කරගෙන කරනු ලබන වගාවක්.) නැතහොත්.

(ii) සත්ව පාලනය නැතහොත්.

(iii) කුඩා කර්මාන්තයක් හෝ කුඩා ව්‍යාපාරයක්.

මෙවැනි වියළි කලාපීය ප්‍රදේශයක්, එක් ස්ථිර ආර්ථික ක්‍රියාවලියකින් පමණක් ස්ථාවර විය නොහැක. ඒ නිසා මෙහිදී අදහස් කරන්නේ ගසක මුල් මණ්ඩලයක් බඳු වූ (එක් මුදුන් මුලක් හා ඒවාට බැඳුණු වට මුල් පද්ධතියක් බඳු වූ) ආර්ථික ක්‍රියාවලියකි. ඒ තුළ මෙතෙක් කර ගෙන ආ පරණ ආර්ථික කාර්යයන් මෙන්ම හඳුනාගත් සුදුසු නව ආර්ථික කාර්යයන්ද ඇතුලත් වේ. මේ සියළු උත්සාහයන්ගෙන් මාසිකව අවම වශයෙන් රු. 2,500 නවත් උත්පාදනයක් අපේක්ෂා කෙරේ.

2. **රු. 35,000ක ප්‍රාග්ධන මූල වටිනාකමක් :**

නූතන ස්ථාවර ආර්ථික ක්‍රියාවලිය සඳහා යොදවා ගත හැකි රු. 35000ක ප්‍රාග්ධන මූල වටිනාකමක් සෑම පවුලකටම ගොඩ නැඟීම මෙහි අපේක්ෂාවයි. එය නොමැති නම් පවතින ග්‍රහණයෙන් දිළිත්දන්ට මිදිය නොහැක. (මෙය තුළ ණය බර, හදිසි අලෙවි පාඩුව ආදිය)

3. **සියළු ණය තුරුස් වලින් තොර රු. 10,000/- ක ඉතිරියක් :**

යහපත් මානසිකත්වයකින් දෛනික අවශ්‍යතාවයන් විසඳා ගැනීම සඳහා යොමු කෙරුණු ඉලක්කයකි.

4. **ස්ථිර වහලක් සහිත නිවසක් (උළු සිවිලිම) :**

සෑම ජනසවි පවුලකටම ස්ථිර වහලක් සහිත නිවසක් ලබාදීම මෙම වැඩ සටහනේ අරමුණයි. ඒ සඳහා 15 දෙනාගේ කණ්ඩායම් සෑදී සිටවූ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

5. **සනීපාරක්ෂක වැසිකිළියක් :**

සෑම පවුලක් සඳහාම සනීපාරක්ෂක වැසිකිළියක් සැකසීම මෙහි අදහසයි. මේ සඳහා " යුනිසෙෆ් " ආධාර ලැබේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

6. ගස් දෙසීය :

වියලි කලාපයේ ගෙවතු විකල්ප වනයක් කරා පරිවර්තනය කිරීම මෙම වැඩ සටහනේ අරමුණයි. එහිදී සෑම ජනසවිලාභී පවුලක්ම තම ගෙවත්තේ වැඩෙන ගස් දෙසීයක් සංරක්ෂණය කිරීමෙත් හෝ සිටුවීමෙත් හෝ මෙයට දායක වනු ඇත. මෙය ප්‍රදේශයේ විතාශයට ගිය වන සම්පත නැවත ඇති කරන පරිසර වැඩසටහනකි. අනෙක් අතට දිගුකාලීන ආර්ථික වැඩසටහනකි.

7. දිරිය පෙරට සංවිධානය :

මාස 24 කට සීමා වෙනැයි ඇතැමුන් විසින් නිර්වචනය කරන ජනසවිය වැඩ සටහන. එයම පදනම් කරගෙන මාස 24 කට සීමා නොවී ජනතාවගේ ආර්ථික හා සාමාජික ශක්තිය දිගින් දිගටම පවත්වා ගෙන යන සංවිධානය දිරිය පෙරට වේ. මෙය දුප්පත්කම දුරලීම සඳහා වූ දුප්පතුන්ගේ සංවිධානයකි.

## සංවිධාන ව්‍යූහය

සංවිධාන ව්‍යූහයේ අංශ තුනකි :

1. ජනසවිලාභීන්ගේ සංවිධානය
2. රාජ්‍ය නිලධාරීන්ගේ සංවිධානය
3. අරටු කණ්ඩායම (මෙහෙයුම් මණ්ඩලය).

**1. ජනසවිලාභීන්ගේ සංවිධානය :**

✡ ජනසවිලාභීන් සඳහාම, දුප්පතුන් සඳහාම වෙන් වූ, ඔවුන් විසින් මෙහෙයවනු ලබන සංවිධානයකි.

✡ දිළිඳුකම පිටු දැකීමට දිගුකාලීන හා අඛණ්ඩ වූ ක්‍රියාවලියකි.

✡ ඒ සඳහා කැප වූ සහ යොමු වූ සංවිධානයකි.

සංවිධාන ස්වරූපය :

මව් සංවිධානය

↓

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ශාඛා සංවිධාන 19 කි. (ජනහමු).

↓

ජනසවිලාභීන්ගේ කුඩා කණ්ඩායම්

(මිනිසුන් හත් අට දෙනා බැඳීත් වූ අවශ්‍යතාවය, ඔනෑ එපාකම් සමානතාවය මත ගොණු ගැන්වීම.)

**2. රාජ්‍ය නිලධාරීන්ගේ සංවිධානය :**

කොට්ඨාශයේ කටයුතු කරන සියළුම නිලධාරීන් ජනසවිය වැඩ සටහන සාර්ථක කිරීම සඳහා දායක කර ගැනීම උදෙසා වූ සංවිධානයකි. අදාල නිලධාරීන් මාසිකව එක්ව සිය කටයුතුවල ප්‍රගති සමාලෝචන සහ ඉදිරි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සිදු කෙරේ. මෙය ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන් රැස්වේ.

**3. අරටු කණ්ඩායම (මෙහෙයුම් මණ්ඩලය) :—**

සංයුතිය :

— ප්‍රාදේශීය ලේකම්.

— ජාතික පුහුණුකරු.

— පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් මතු වූ ක්‍රියාකාරකයින්.

Δ ප්‍රාදේශීය පුහුණුකරුවන්.

Δ ග්‍රාම නිලධාරීන්.

Δ කෘෂිකර්ම නිලධාරීන්.

Δ බැංකු සහ සමුපකාර නිලධාරීන්.

Δ වෙනත් ක්ෂේත්‍ර නිලධාරීන්.

සමස්ත වැඩ සටහන තුළ සියළු දායකයින්ගේ සහභාගිත්වය ලබා ගන්නා සහ උරා ගන්නා හා මෙහෙයුමක් පවත්වා ගෙන යනු ලැබේ. ක්‍රියාකාරී නොවන්නන් හෙළිදරව් කරන. ක්‍රියාවට ඇද ගන්නා උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා ප්‍රාදේශීය පුහුණුකරුවන් සහ ග්‍රාම නිලධාරීන් සහාය වේ.

## විශේෂතා

1. ජනසවිය වැඩසටහන වෙන්ව ක්‍රියාත්මක වීම වෙනුවට කොට්ඨාශයේ අනෙකුත් වැඩසටහන් සමඟ ඒකාබද්ධව එකම වැඩසටහනක් ක්‍රියාත්මක වීම.

2. වැඩසටහනෙහි අවශ්‍යතාවයන් සහ ඕනෑ එපාකම්වලට අනුකූලව සම්ප්‍රදායික නීතිරීති අර්ථවත්ව යොදා ගැනීම.

3. ක්‍රියාවලිය තුළින් ඉගෙනීම හා ඉගෙනීම තුළින් ක්‍රියාත්මක කිරීම.

4. පටු පුද්ගලික වාදීන් නොවී දායකවීමට අවශ්‍ය සහ හැකි සියළුම කණ්ඩායම් වල සහ පිරිස් යහමග වීමේ විවෘත භාවය.

5. ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ දිරි ගැන්වීම හා ආශිර්වාදය.

6. කරුවලගස්වැව කොට්ඨාශයේ ජනසවිය අත්දැකීම් ඉවහල් කර ගැනීම.

# කැපීපෙනෙන ජයග්‍රහණ

1. ස්ථාවර ආර්ථිකයක් :—

- ✡ කෘෂි ළිං 50ක තිමාව.
- ✡ තවත් කෘෂි ළිං 400ක් ඉදිවෙමින් පැවතීම.
- ✡ මීඔය සහ තාත්තේරිය ඔය දැලේ වගා වැඩසටහන. (කණ්ඩායම් 50ක් තියැලීම)
- ✡ වතුර පොම්ප 125ක් (ආසන්න වශයෙන්) ප්‍රයෝජනයට ගෙන කරන ගොවිතැන.
- ✡ ජනසවිලාභී පවුල්වලින් 35%ක් පමණ සත්ව පාලන ව්‍යාපෘතිවල නිරත වීම.
- ✡ විකල්ප මහජන පශු වෛද්‍ය සේවාවක් ආරම්භ වීම.
- ✡ පවුල් 300ක් සහල් ගම්මාන වැඩසටහනෙහි නිරත වීම.

2. අරමුදල් (රු. 35,000 ප්‍රාග්ධන මූල වටිනාකම සහ රු. 10,000ක) ඉතිරි කිරීම :—

රු. 8,40,00,000ක වැය ඇස්තමේන්තුවකින් එක් අවුරුද්දකදී වැය වීමට තිබුණි. රු. 4,20,00,000ක්. එහෙත් එයින් දැනට වැය වී ඇත්තේ රු. 2,16,00,000කි. ඉතිරි රු. 24,00,000ක් ඉතිරි කර තිබේ. ඒවා පෞද්ගලික හා පොදු ගිණුම්වල තැන්පත්ව ඇත.

3. උළු සිවිටුව :—

- ✡ නිවාස 500කට පළමු ශ්‍රේණියේ උළු දැනට ලබා දී ඇත.
- ✡ පළමු පියවර කණ්ඩායම් එකතු වී උළු කර්මාන්තශාලා වෙත ගොස් උළු ලබා ගත්තා විට උළු 1000ක මිල රු. 5,450කි.
- ✡ දෙවන පියවරේදී නිවාස සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරගෙන කම්හල වෙත ගොස් උළු ගෙන ඒමේදී උළු 1000 රු. 4,750කි.
- ✡ තෙවන පියවරේදී උළු ජනසවිලාභියාගේ නිවසටම ගෙනවිත් බාර දීමේදී මුදුන් උළු 25ක් සමඟ උළු 1000ක් රු. 4,500කි. පළමු සහ දෙවන පියවරයන්හිදී සිදු වූයේ මුදල් ගෙවා උළු රැගෙන ඒමයි. තෙවන පියවරේදී මුදල් ගෙවීම සිදු වන්නේ නිශ්චිත වශයෙන්ම පළමු පන්තියේ උළු බව උළු ලාභියා විසින් තීරණය කිරීමෙන් පසුවය. තීරණය ගැනීමට දින 5ක කාලයක් ඇත.
- ✡ සැපයුම්කරුවන් තුළ තරඟකාරීත්වයක් ඇති කර ජනසවිලාභීන්ගේ කේවල් කිරීමේ ශක්තිය ඇති කර ජනසවිලාභීන්ටම වටහා ගැනීමට අවස්ථාව ලබා දීම.

✡ ජනසවිලාභීන් සංවිධානය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් රු. 2,500ක ලාභයක් එක් ජනසවිලාභියකුට ලැබේ.

තනිව ගෙන ඒම = සාමූහිකව ගෙන ඒම – ලාභය.
රු. 7,000 – රු. 4,500 = රු. 2,500කි.
සමස්ථ ජනසවිලාභීන්ගේ ලාභය = රු. 60,00,000කි.
රු. 2,500 × රු. 2,400 = රු. 60,00,000කි.

මෙය ජනසවිලාභීන්ගේ අවශ්‍යතාවයන්ගෙන් අල්පයක් පමණි. එවන් අල්පයකින් ලබාගත් ජයග්‍රහණය ඉහත අයුරුයි.

උළු සිටවුවේ අරමුදල දැනට රු. 50,00,000කි. (ලක්ෂ පනහකි)

4. සනීපාරක්ෂක ජල මුද්‍රිත වැසිකිළි :–

මුළු පවුල් සංඛ්‍යාවෙන් 95%ක් වැසිකිළි නොමැති අය විය. දැනට එම පවුල්වලින් 2,300ක් වැසිකිළි තනා නිම කර ඇත. යුනිසෙෆ් ආධාර යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නවයක වැසිකිළි වැඩ සටහන ක්‍රියාත්මක වේ. එයට ජනසවිය ලැබුණු, ලැබෙන සහ නො ලැබුණු කොට්ඨාශ ඇතුළත් වේ. ඒ අනුව අනෙක් කිසිදු කොට්ඨාශයක් අත්පත් කර ගන්නට වඩා වැඩි ඉලක්කයක් මෙම කොට්ඨාශ අත්පත් කර ගෙන ඇත.

5. ගස් දෙසීය :–

සියළුම ජනසවිලාභී පවුල් අවතීර්ණ වී ඇත.

6. දිරිය පෙරට සංවිධානය :–

සියළුම ජනසවිලාභීන් සංවිධාන ගතව සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකම දිරිය පෙරට සංවිධානය ගොඩනගා තිබේ. මව් සංවිධානය ගොඩනැගෙමින් පවතී. මෙම ක්‍රියාවලිය තුළ සංවිධාන ශක්තිය තේරුම් ගත් ජනසවිලාභීන් නැවත නැවත කලම්බන ක්‍රියාවලියේ යෙදේ. මුළු කොට්ඨාශයේම සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන කාරණය ලෙසට මෙම සංවිධානය පත් වෙමින් පවතී.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

''සාගත වසංගත හැම මග හැරියන්
මහට ම වගේ යළටත් වැව් පිරියන්
හැම දියුණුවම පිළිබඳ කිරි' තිරියන්
වත්තිය වෙනස් වුනු ද මා මැරියන්''

— විමලරත්න කුමාරගම

මිල : රු. 10.00

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි